**සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව - 2022**

**------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ ("බැංකුව") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය බැංකුව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා බැංකුවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය .

### 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, හා ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛන්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, බැංකුව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකගේ 2021 ජනවාරි 05 දිනැති අංක: 02/19/319/0001/004 දරන ලිපියට අනුව, බැංකුව ඇවර කිරීමට හෝ ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමඟ ඒකාබද්ධ කිරීමට තීරණය කර තිබුණත්, එදින සිට එහි මෙහෙයුම් කටයුතු, ණය ගෙවීම සහ තැන්පතු ලබා ගැනීම තාවකාලිකව අත්හිටුවීමට නියෝග කර ඇති අතර එම තීරණය වාර්තා කරන දිනය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව (NSB) සමඟ යෝජිත ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය සියළු දේ කර ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ (NSB) පනත සංශෝධනය කළ යුතු බව ජාතික ඉතිරිකිරීමේ බැංකුව (NSB) විසින් අපට දන්වා ඇති අතර ජාතික ඉතිරිකිරීමේ බැංකුව (NSB) විසින් භාණ්ඩාගාරය වෙත මෙම ඉල්ලීම කර ඇත. භාණ්ඩාගාරය විසින් කැබිනට් පත්‍රිකාවක් සකස් කර ඇති අතර මේ වන විට මෙම පත්‍රිකාවට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට නියමිතය | පවතින සම්පත් නිෂ්කාර්ය නොවන පරිදි ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය වේගවත් කළ යුතුය. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවෙන් පවරා ඇති පහත දැක්වෙන වත්කම් සම්පූර්ණයෙන්ම හානිකරණය කර ඇති අතර එම ශේෂයන් සත්‍යාපනය කිරීමට සාක්ෂි කිසිවක් හමු නොවුණි.<br><br>අයිතමය — වටිනාකම (රු.)<br>අත්තිකාරම් මත ගෙවිය යුතු වට්ටම් — 13,356,809<br>ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ (PSDB) නීති කටයුතු වෙනුවෙන් වූ තැන්පතු අරමුදල — 7,098,200 | 1. ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුව (PSDB) පවරා ගන්නා විට අත්තිකාරම් මත ගෙවිය යුතු වට්ටම් ශේෂය මාරු කර ඇත. එබැවින්, සත්‍යාපනය සඳහා සාක්ෂි නොපැවතුණි.<br>2. ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ (PSDB) සේවකයින්ගේ පාරිතෝෂික ගෙවීම් පිළිබඳ ගැටළුවක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියාචනා නඩු දෙකක් විභාග වෙමින් පවතින අතර එහි සම්පූර්ණ වටිනාකම රු.7,098,200 කි. එම නඩු වන්නේ,<br>• SC/HC/LA/01/2017<br>• SC/HC/LA/02/2017 | මූල්‍ය ප්‍රකාශන වල ඇති සෑම ශේෂයන් සඳහාම සාක්ෂි සහ සවිස්තරාත්මක සටහන් පවත්වා ගත යුතුය. |
| ii. 2020 අප්‍රේල් සිට 2022 දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ මාතර ශාඛාවේ කුලී වියදම ලෙස රු.6,200,000ක් දරා තිබුණද, 2023 මාර්තු 31 වන විගණිත දිනය වන විටත් බැංකුව ගොඩනැගිල්ලේ හිමිකරු (NSB) සමඟ කුලී ගිවිසුමකට එළඹී නොතිබුණි. | ගෙවිය යුතු මාසික කුලිය සම්බන්ධයෙන් මව් සමාගම වන ජාතික ඉතිරි කිරීමේ බැංකුව (NSB) සමඟ සාකච්ඡා සිදු වෙමින් පවතී. සාකච්ඡා අවසන් වීමෙන් පසු ගිවිසුමක් අත්සන් කර කුලිය ගෙවනු ඇත. | නීතිමය කාරණාවලට එරෙහිව බැංකුවේ අභිමතය සුරක්ෂිත කිරීම සඳහා කුලී ගිවිසුමකට එළඹීමට නිර්දේශ කරමි. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පහත දක්වා ඇති ලැබිය යුතු ශේෂ වර්ෂ කිහිපයක සිට අයකර ගැනීමකින් තොරව හිඟව පැවතුණි. | **ලැබිය යුතු මුද්දර ගාස්තු -** වටිනාකම යනු ණය පැහැර හරින ලද පාරිභෝගියකුගේ උකස් කළ දේපළක් බැංකුවට ලබා ගැනීමේදී කරන ලද ගෙවීමකි. මෙම වටිනාකම ආපසු අයකර ගත හැකි වන්නේ දේපළ බැහැර කළ විට පමණි.<br>**පසු දාතම් චෙක්පත් වට්ටම් ගිණුම -** ශේෂය අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>**ලැබිය යුතු ජේෂ්ඨ පුරවැසි ස්ථාවර තැන්පතු- සහනාධාර**<br>2021 අප්‍රේල් 01 සිට 2022 ජූනි 30 දක්වා වූ කාලය සඳහා ජේෂ්ඨ පුරවැසියන්ට ගෙවන ලද පොළිය සම්බන්ධයෙන් බැංකුව වෙත භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල මෙය වේ. | දිගුකාලීන හිඟ ශේෂයන් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

| විෂයය | වටිනාකම (රු.) |
|---|---|
| ලැබිය යුතු මුද්දර ගාස්තු | 1,999,000 |
| පසු දාතම් චෙක්පත් වට්ටම් ගිණුම | 349,200 |
| ලැබිය යුතු ජේ්‍යෂ්ඨ පුරවැසි ස්ථාවර තැන්පතු- සහනධාර | 3,045,845 |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| “ගෙවිය යුතු වෙනත් ණය හිමියන් ‘’ යටතේ හෙළිදරව් කරන ලද ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ (PSDB) ණය ගැනීම් වලින් රු.32,249,689 ක වටිනාකමක් වසර දෙකකට වඩා වැඩි කාලයක් පැවතුණි. | **ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ (PSDB)-ණයහිමියන් -** ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ (PSDB) ණය ගිණුමේ නොපියවූ ශේෂයන් ඉතිරිව පැවතුණි. | හිඟ ශේෂ සාධාරණ කාලසීමාවක් තුළ සැසඳීම සිදු කර නිෂ්කාශනය කළ යුතුය. |

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශවලට අනුව, රු.855,074 ක ශේෂ මාස 06 සිට වර්ෂ 05 දක්වා කාල පරාසයක් තුළ නිෂ්කාශනය නොවී පැවතුණි. | **ගිණුම්ගත නොකළ බැංකු බැර -රු. 841,674:** මෙයට මහජන බැංකුවේ ජංගම ගිණුමේ හඳුනා නොගත් තැන්පතු ඇතුළත් වේ. එය 2023 වර්ෂයේ දී නිවැරදි කරනු ලැබේ.<br>**දෝෂ දැක්වීම -** රු.13,400: 2023 වර්ෂයේ දී නිවැරදි කරනු ලැබේ. | බැංකුවේ මෙහෙයුම් දුර්වලතා මඟහරවා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රියාපරිපාටිය ශක්තිමත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු .445,149,667 ක ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ එයට අනුරූප ලාභය රු.255,144,487 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.190,005,180 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මූල්‍ය උපකරණවල පොළී ආදායම ඉහළ යාම සහ තැන්පතු අඩු වීම නිසා පොළී වියදම අඩු වීම හේතු වී තිබුණි.

## 2.2 අනුපාත විශ්ලේෂණය

ලබා දී ඇති තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා බැංකුවේ ඇතැම් වැදගත් අනුපාත පෙර වසර සඳහා වූ ආංශික අනුපාතයන් සමඟ සැසඳීම පහත දැක්වේ.

| විස්තරය | ආංශික අනුපාත | | සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව (SLSBL) | |
|---|---|---|---|---|
| | **2022** | **2021** | **2022** | **2021** |
| ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය (ROE) (%) | 2.3 | 21.5 | 6.40 | 4 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (ROA) (%) | 0.1 | 1.7 | 5.19 | 4 |
| ශුද්ධ පොලී ආන්තිකය(%) | 2.4 | 4.1 | 14.98 | 7 |
| ද්‍රවශීලතා වත්කම් අනුපාතය | 30.9 | 6.5 | 954 | 742 |
| අවදානම මත බර තැබූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය-ස්ථර 1 (අවම අවශ්‍යතාව 5%) | 14.20 | 52.8 | 165 | 101 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකගේ උපදෙස් පරිදි ඒකාබද්ධයට අදාළ කටයුතු ක්‍රියාත්මක කිරීම ප්‍රධාන ප්‍රමුඛතාවය වුවද, බැංකුව වගකීම් විරහිතව ක්‍රියා කළ අවස්ථා කිහිපයක් තිබුණි. සමහර අවස්ථා පහත දැක්වේ.<br><br>i. 2022 මැයි 23 දිනැති 2022 අංක 04 දරන බැංකු පනත් නියෝගයේ 7.2 ඡේදයේ උපදෙස් පරිදි, සුදුසු මූල්‍ය ආයතනයක් සමඟ ඒකාබද්ධ කිරීමට හෝ ඒකාබද්ධ කිරීමට සැලසුම් ඇතුලත් ප්‍රාග්ධන වර්ධක සැලැස්ම බැංකුව විසින් ඉදිරිපත් කර නොතිබුණි.<br><br>ii. ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකගේ 2023පෙබරවාරි 03දිනැති අංක 005/0001/319/19/02දරන ලිපියට අනුව දක්ෂ කාර්ය මණ්ඩලයක ඇති ඌනතාවය හේතුවෙන් ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව )SLSBL( හි ඇති මෙහෙයුම් දුෂ්කරතාවයන් නිසා බැංකුව විසින් ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය නැවත අවධාරණය කරන ලදී. | අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයේ කිසියම් හිඟයක් සඳහා මව් සමාගම විසින් අරමුදල් සපයනු ලබන බවට මව් සමාගම 10/12/2020 දින එකඟතාවක් ලබා දී ඇත. මහ බැංකුව ඒ පිළිබඳව මව් සමාගමෙන් සහතිකවීමක් ඉල්ලා ඇති අතර අප විසින් 14/02/2023 දිනැති ලිපියෙන් සහතිකවීමක් ඉල්ලා සිටින ලදී.<br>(ලිපි දෙකේම පිටපත් මේ සමඟ අමුණා ඇත.) | මව් සමාගම සමඟ සාකච්ඡා කර බැංකුව ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය වේගවත් කළ යුතුය. |

iii. ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකගේ 2022මැයි 27දිනැති අංක 005/0001/319/19/02 දරන ලිපියේ දක්වා ඇති පරිදි ජාතික ඉතිරි කිරීමේ බැංකුව(NSB) සහ ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව (SLSBL) යන දෙකටම ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව සඳහා වූ මුදල් මණ්ඩලය විසින් අනුමත කර ඇති විසඳුම් රාමුව ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දී තිබුණි. කෙසේ වෙතත් , විසඳුම් රාමුවට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට දැනුම් දෙන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග නියමිත වේලාවට ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට බැංකු දෙකම අපොහොසත් වී තිබුණි.

iv. ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකගේ 2022ජනවාරි 13දිනැති අංක 005/0001/319/19/02දරන ලිපියේ දක්වා ඇති පරිදි යථාර්ථවාදී නොවන පුරෝකථන සහ ප්‍රධාන අවදානම් තක්සේරු සාධක නොසලකා බැංකුව විසින් 2026-2022 කාලසීමාව සඳහා උපාය මාර්ගික ව්‍යාපාර සැලැස්ම ඉදිරිපත් කර තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | 2015 වසරෙන් පසු භෞතික සත්‍යාපනය සිදු කර නොමැති බැවින් බැංකුව දැනට පවතින ස්ථාවර වත්කම් ලේඛනය භෞතික සත්‍යාපනය මත යාවත්කාලීන කර නොතිබුණි. අභ්‍යන්තර විගණන වාර්තා වලට අනුව, තහවුරු නොකළ සහ භෞතිකව ලබා ගත නොහැකි ස්ථාවර වත්කම් පිළිවෙලින් රු. 16,347,641ක් සහ රු.649,320ක් වුණි. | මෙය දැනටමත් නිවැරදි කර ඇත. ස්ථාවර වත්කම් වල භෞතික සත්‍යාපනය අවසන් කර ඇති අතර සංශෝධිත ස්ථාවර වත්කම් ලේඛනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2023.03.29 වන දින ලබා ගන්නා ලදී. | ස්ථාවර වත්කම් වල භෞතික සත්‍යාපනය සාධාරණ කාල සීමාවක් තුළ සිදු කළ යුතුය. |
| ii. | මෙහෙයුම් අත්හිටුවීමෙන් පසු බැංකුවේ ණය අයකර ගැනීමේ ප්‍රගතිය බොහෝ ණය වර්ග සඳහා සතුටුදායක මට්ටමක පැවතියද, SLS දිරිය ණය යෝජනා ක්‍රමයේ අක්‍රීය ණය ප්‍රමාණයේ සැලකිය යුතු වර්ධනයක් 2023 මාර්තු 31 දිනට නිරීක්ෂණය වුණි. මෙහෙයුම් අත්හිටුවන දිනයේ පැවති අක්‍රීය ණය අනුපාතය සමඟ සැසඳීමේදී එය සියයට 411 කින් වැඩි වී තිබුණි. | SLS දිරිය ණය යෝජනා ක්‍රමය සමන්විත වන්නේ කොවිඩ් 19 වසංගතයෙන් සහ රටේ මෑතකාලීන ආර්ථික අර්බුදයෙන් වැඩිම බලපෑමක් එල්ල වූ අංශය වන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට ලබා දී ඇති ණය වලිනි.<br>බොහෝ කුඩා හා මධ්‍ය පරිමාණ ණයගැතියන් සම්බන්ධයෙන් ගත් | බැංකුවේ ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | කල, 2022 වර්ෂයේ කාලසීමාව තුළ සැලකිය යුතු විශාල වටිනාකමකින් යුත් ණය කිහිපයක් අක්‍රීය ණය වෙත මාරු කර ඇත. 2023.03.31 වන විට අක්‍රීය ණය ගණන 15 ක් වූ අතර එයින් රු.මිලියන 9.2 ක වටිනාකමකින් යුතු ණය පහසුකම් දෙකක් 2023.06.30 දිනට පියවා ඇත.<br><br>මෙම පහසුකම් විධිමත් කිරීමට බැංකුව හැකි සෑම උත්සාහයක්ම ගෙන ඇති අතර සමහර පහසුකම් මේ වන විට නීතිමය ක්‍රියාමාර්ග යටතේ පවතින අතර පහසුකම් කිහිපයක් ප්‍රතිලේඛන ගත කිරීමේ ක්‍රියාවලිය යටතේ පවතී.<br>ඒ අනුව 2023.06.30 වන විට අක්‍රීය ණය ශේෂය රු. මිලියන 121 ක් දක්වා එනම් රු.මිලියන 10 කින් අඩු වී ඇත. බැංකුව විසින් ගනු ලබන දැඩි අයකර ගැනීමේ ක්‍රියාමාර්ග හේතුවෙන් වසර අවසාන වන විට අක්‍රීය ණය ශේෂය තවදුරටත් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. | |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| I. | ලේකම් ශ්‍රේණිය I සඳහා වෘත්තිය ගමන් මාර්ගයක් නොමැතිකම යන්න සලකා බලා, 2020 සැප්තැම්බර් 01 දින ලසුලේඛක- III තනතුරු සඳහා සේවකයින් දෙදෙනෙකු උසස් කරනු ලැබුවද, අනුමත සෙවක සංඛ්‍යාව තුළ එම තනතුර නොතිබුණි. | 2019 දෙසැම්බර් 18 වන දින ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ (NSB) සාමාන්‍යාධිකාරී /ප්‍රධාන විධායක නිලධාරියාගේ ප්‍රධානත්වයෙන් පැවති විධායක මානව සම්පත් කමිටු රැස්වීමේදී මෙම තීරණය ගන්නා ලදී. ලේකම් ශ්‍රේණිය I සඳහා වෘත්තීය ගමන් මාර්ගයක් නොමැතිකම යන්න සලකා ඔවුන්ගේ මීළඟ උසස්වීම ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ (NSB) ව්‍යුහයට අනුකූල වන පරිදි, ලසුලේඛක- III ශ්‍රේණියේ ස්ථානගත කිරීමට කමිටුව තීරණය කර තිබුණි. | බැංකුව අනුමත සේවක සංඛ්‍යාව සහ අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුගත විය යුතුය. |
| ii. | 2023 මාර්තු 31 දිනට බැංකුවේ අනුමත සේවක සංඛ්‍යාව 102 ක් වන අතර ඔවුන්ට 2021 ජනවාරි 05 සිට 2023 මාර්තු 31 දක්වා සේවක වැටුප් සහ ප්‍රසාද දීමනා | 2021 ජනවාරි 05 වන දින සිට බැංකුවේ තැන්පතු ලබා ගැනීම සහ ණය දීමේ කටයුතු සීමා කර ඇතත්, අයකර ගැනීම්, නීති ක්‍රියාමාර්ග, මූල්‍ය වාර්තාකරණය, අවදානම් කළමනාකරණය සහ අනුකූලතාවය, | බැංකුවේ මානව සම්පත ඵලදායී ආකාරයට භාවිතා කළ යුතුය. |

ලෙස රු.553,344,959 ක් ගෙවා තිබුණි. කාර්ය මණ්ඩල වැටුප් ලෙස සැලකිය යුතු පිරිවැයක් දැරීමට සිදු වුවද, බැංකුවේ ප්‍රධාන මෙහෙයුම් තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් දරන ලද පිරිවැයට ප්‍රශස්ථ ප්‍රතිලාභයක් බැංකුවට ගෙන ඒමට නොහැකි වී තිබුණි.

බැංකුවේ ඒකාබද්ධ කිරීමේ යෝජනාව ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම හේතුවෙන් මෙම තත්ත්වය ඉදිරි කාලය සඳහා ද පවතිනු ඇති බව පෙනේ.

භාණ්ඩාගාර කළමනාකරණය සහ ශාඛා මෙහෙයුම් සිදු කරන අතරතුර බැංකුව සියළුම නියාමන සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතා පිළිපැදිය යුතුය.

බැංකුව විසින් ජාතික ඉතිරි කිරීමේ බැංකුව (NSB) සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම (NSBFMC) වෙත 2022 දී ද්විතීයික පදනම මත කාර්ය මණ්ඩල සාමාජිකයන් 05 කු යවා ඇත. තවද, ද්විතීක පදනම මත තවත් කාර්ය මණ්ඩලයක් නිදහස් කළ හැකි බව බැංකුව විසින් මව් සමාගම වන ජාතික ඉතිරි කිරීමේ බැංකුව (NSB) වෙත දන්වා ඇත.

තවද, 2023.09.30 වන විට ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) මෑතකදී අවසන් දිනය ලබා දී ඇත.

එකඟ වූ සහ අනුමත වූ වැටුප් ප්‍රතිපත්තිවලට අනුව සේවක වැටුප් ගෙවනු ලැබේ.